**2024-07-09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ඓතිහාසික කල්‍යාණි නදී උදකුක්ඛේප සීමාමාලකය ඉදිකිරීම**

මහා විහාරවංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව විසින් වර්ෂ 150කට අධික කාලයක සිට එහි උපසම්පදා විනය කර්මය සිදු කරනු ලබන්නේ කැලණි නදියෙහි තාවකාලිකව ඉදි කරන ලද උදකුක්ඛේප සීමාමාලකය තුළදීය. වාර්ෂිකව එම තාවකාලික සීමාමාලකය ඉදිකිරීම සඳහා අධික ශ්‍රමයක් වැය කිරීම මෙන්ම දැරීමට සිදු වන පිරිවැය ද සැලකිල්ලට ගෙන, කැලණි ගංගාව අසල පිහිටි එම සංඝ සභාවට අයත් වෙන්නවත්ත ශ්‍රී කල්‍යාණවංශිකාරාම විහාරස්ථාන භූමියෙහි ස්ථිර උපෝසථාගාරයක් ගොඩනැංවීමට සංඝ සභාව විසින් තීරණය කරනු ලැබ ඇත. ගරු අග්‍රාමාත්‍යතුමා විසින් එම කරුණ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව සැලකිල්ලට ගෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ හා උපදෙස් මත යෝජිත ඓතිහාසික කල්‍යාණි නදී උදකුක්ඛේප සීමාමාලක ගොඩනැගිල්ල ඉදි කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

**02. ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය පිටුදැකීම සඳහා වූ බහු-ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම II - (2024-2028)**

සාධාරණ හා හිංසනයෙන් තොර සමාජ පරිසරයක ජීවත් වීම සඳහා කාන්තාවන්ට, පුරුෂයන්ට, ළමයින්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ විවිධත්වයක් ඇති සෑම කණ්ඩායමකටම ඇති අයිතිය තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් අවශ්‍ය බැවින් ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා වන පළමු ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2012-2020 කාලය තුළ ඒකාබද්ධ ප්‍රවේශයකින් යුතුව ක්‍රියාත්මක කර තිබේ. එම ක්‍රියාකාරී සැලැස්මෙහි බලපෑම පිළිබඳ සිදු කරන ලද පසුවිපරම් සහ තක්සේරු ක්‍රියාවලියේදී නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, අදාළ සියලුම පාර්ශ්වකාර ආයතනවල අදහස් විමසමින් සකස් කරනු ලැබ ඇති ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය පිටුදැකීම සඳහා වූ බහු-ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම II



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු ⁄ தொ T - (+94 11) 2515759
ෆැ ⁄ பெ F - (+94 11) 2514753
ඊ ⁄ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

(2024-2028) ක්‍රියාත්මක කිරීම පිණිස කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. සංවර්ධනය උදෙසා හරිත හයිඩ්‍රජන් තාක්ෂණය ක්‍රියාත්මක කිරීම**

හරිත හයිඩ්‍රජන්වල අගය එකතු කළ නිෂ්පාදනයක් වන හරිත ඇමෝනියා, දීර්ඝ ගමනාන්තයන් වෙත ගැඹුරු මුහුද හරහා බලශක්තිය ප්‍රවාහනය කිරීම සඳහා සාම්ප්‍රදායික පොසිල ඉන්ධන වෙනුවට භාවිත කළ හැකි පරිසර හිතකාමී විකල්පයක් ලෙස හඳුනාගෙන ඇත. බලශක්ති ප්‍රවාහනය සඳහා යොදාගත හැකි වාණිජ හරිත ඇමෝනියා සඳහා වන ඉල්ලුම ගෝලීය වෙළෙඳපොළ තුළ සැලකිය යුතු ලෙස වර්ධනය වෙමින් පවතී. එම ඉල්ලුම 2030 වන විට ටොන් බිලියන ගණනක් දක්වා ඉහළ යනු ඇතැයි ද පුරෝකථනය කර තිබේ. ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති සම්පත්වලින් බහුල වීම සහ නැගෙනහිර-බටහිර නාවික මාර්ගයට ආසන්නයේ පිහිටීම වැනි සුවිශේෂ භූගෝලීය වාසි හේතුවෙන් හරිත බලශක්ති නිෂ්පාදකයෙක්, අපනයනකරුවෙක් සහ කලාපීය බලශක්ති කේන්ද්‍රස්ථානයක් වශයෙන් ස්ථාපනය වීම සඳහා වැඩි අවස්ථාවක් පවතී. ඒ අනුව, හරිත හයිඩ්‍රජන්/ඇමෝනියා නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉදිරිපත් වන පුද්ගලික අංශයේ ආයෝජන යෝජනා ඇගයීමට ලක් කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අදාළ ආයතනවල නියෝජනයන්ගෙන් සමන්විත ව්‍යාපෘති කමිටුවක් පත් කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. රාජගිරිය, බුත්ගමුව පාරට යාබදව පිහිටි ජල රක්ෂිත ඉඩම් කොටසක් නාගරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම**

කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ආශ්‍රිත ප්‍රදේශයේ ජල ගැලීම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, කොළොන්නාව හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි වගුරු ඉඩම් කොටස් ජල රැඳවුම් ස්ථාන ලෙස පවත්වාගෙන යාම සඳහා රජයට අත්කර ගෙන ඇත. ඒ යටතේ අත්කර ගන්නා ලද රාජගිරිය, බුත්ගමුව පාරට යාබදව පිහිටි ජල රක්ෂිත ඉඩම් අනවසර ඉදිකිරීම සහ වෙනත් කාර්යයන් සඳහා

යොදා ගැනීමට ඇතැම් පාර්ශ්වයන් විසින් උත්සාහ දරන අතර, එකී ඉඩම් ආරක්ෂා කර ගනිමින් ඒවා පවරා ගැනීමේ අරමුණුවලට හානියක් නොවන පරිදි ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මග පෙන්වීම යටතේ යෝග්‍ය සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීම සුදුසු බවට පෙනී ගොස් ඇත. ඒ අනුව හඳුනා ගනු ලැබ ඇති ඉඩම් කොටසක් ආදායම් උත්පාදන මාර්ග සහිතව පෞද්ගලික අංශයේ දායකත්වය ද ලබා ගනිමින් නාගරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම පිණිස යෝජනා කැඳවීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **කොල්ලුපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩම් කොටසක් එක්ස්පො ප්‍රොපර්ටි ඩිවෙලොපර්ස් (පුද්ගලික) සමාගම වෙත නිවාස ව්‍යාපෘතියක් සඳහා ලබා දීම**

කොල්ලුපිටිය, මුහුදු මාවත ප්‍රදේශයේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය සතු පර්චස් 40ක ඉඩම් කොටසක් අවුරුදු 50ක දීර්ඝකාලීන බදු පදනම මත එක්ස්පො ප්‍රොපර්ටි ඩිවෙලොපර්ස් (පුද්ගලික) සමාගම වෙත බැහැර කිරීම සඳහා 2007 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන පරිදි අනුමැතිය ලබා දී ඇති අතර, ඒ සඳහා වන වටිනාකමින් 25%කට සමාන මුදලක් ද අයකර ගනු ලැබ ඇත. එහෙත්, එකී ඉඩමේ අනවසර පදිංචිකරුවෙකු සිටීම හේතුවෙන් ඉඩම් කොටස පැවරීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත. එම ඉඩමට යාව පිහිටි තවත් පර්චස් 12ක් ද ඇතුළුව පර්චස් 52ක සම්පූර්ණ ඉඩම් කොටස නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස වසර 99ක බදු පදනම මත ලබා දෙන ලෙස එක්ස්පො ප්‍රොපර්ටි ඩිවෙලොපර්ස් (පුද්ගලික) සමාගම විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබේ. ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වර්තමාන තක්සේරුව මත පදනම්ව අදාළ ඉඩම් කොටස වසර 99ක බදු පදනම මත එක්ස්පො ප්‍රොපර්ටි ඩිවෙලොපර්ස් (පුද්ගලික) සමාගම වෙත පවරා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **නුවරඑළිය, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කවල පිහිටි වතු ආශ්‍රිතව තෝරා ගත් පාසල්වල සුහුරු පන්ති කාමර 60ක් ඉදිකිරීම**

ඉන්දියානු රජයේ මූල්‍ය ආධාර සහ ශ්‍රී ලංකා රජයේ දායකත්වය යටතේ නුවරඑළිය, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කවල පිහිටි තෝරා ගත් වතු ආශ්‍රිත පාසල්වල උසස් පෙළ පන්ති සඳහා සුහුරු පන්ති කාමර 60ක් ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස ඉන්දියානු රජය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම සඳහා 2023-12-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම ව්‍යාපෘතිය උසස් පෙළ සිසුන් පමණක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ගැටලු සැලකිල්ලට ගෙන, එම සීමාව ඉවත් කිරීමට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවකදී තීරණය කර තිබේ. ඒ අනුව, අදාළ අවබෝධතා ගිවිසුම සංශෝධනය කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පියවර ගනු ලබන බවට ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

07. **ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සිසුසැරිය සේවා ව්‍යාපෘතිය පුළුල් කිරීම**

පාසල් දරුවන්ට මානසික හෝ ශාරීරික අපහසුතාවකින් තොරව නියමිත වේලාවට පාසල් වෙත පැමිණීමටත්, අධ්‍යාපන කටයුතු නිමා කොට ආරක්ෂිතව නිවෙස් කරා යාමටත් හැකි වන පරිදි සහන ගාස්තු ක්‍රමයක් යටතේ වඩා විශ්වසනීය බස් රථ සේවාවක් සැපයීමේ අරමුණින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2005 වර්ෂයේ සිට සිසුසැරිය ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ. එම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ මඟින් සිසුන් ප්‍රවාහනය කිරීම සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි සිසුසැරිය බස්රථ සේවාවන් 1,537ක් මේ වනවිට ක්‍රියාත්මක වන අතර, දිනකට පාසල් ළමුන් ලක්ෂයකට පමණ එමඟින් ප්‍රවාහන පහසුකම් සැපයේ. එම ව්‍යාපෘතිය යටතේ බස් ගාස්තුවෙන් අඩක් පමණක් සිසුන්ගෙන් අයකරනු ලබන බැවින්, ධාවකයාට වන හානිය ප්‍රතිපූරණය කිරීම සඳහා කිලෝමීටරයකට රුපියල් 105/-ක් බැගින් දිනකට උපරිම කිලෝමීටර 110ක් සඳහා සහනාධාර ගෙවීම කිරීම කරනු ලබයි. ඉන්ධන මිල ඉහළ

යාම හේතුවෙන් පෞද්ගලික ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට නොහැකි වීම මත ආර්ථික පීඩාවට පත්වූ දෙමාපියන් සහ පාසල් විසින් මෙම සිසුසැරිය සේවාව ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් ඉහළ ගොස් ඇත. ඒ අනුව, 2024 වර්ෂය තුළ නව සිසුසැරිය සේවා 500ක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය රුපියල් මිලියන 202ක ප්‍රතිපාදන ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් උපයාගනු ලබන අරමුදලින් වෙන් කර ගැනීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **1990 සුව සැරිය පදනමට නොමිලේ ප්‍රදාන වශයෙන් ගිලන් රථ ලබා ගැනීම**

පූර්ව රෝහල් ප්‍රතිකාර හා හදිසි රෝගී ප්‍රතිකාර සේවාවන් කඩිනමින් සලසා දීම සඳහා 2016 වසරේදී ඉන්දීය රජයේ ප්‍රදානයක් යටතේ ඉන්දියාවේ පිහිටි TATA Sons (Pvt) Ltd ආයතනයෙන් ලබාගත් ගිලන් රථ 297ක් යොදාගෙන "1990 සුව සැරිය පදනම" ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා රජයෙන් ලබා දුන් ගිලන් රථ 25ක් ද ඇතුළුව මේ වන විට ගිලන් රථ 322ක් මේ සඳහා යොදවා තිබේ. සුව සැරිය පදනමේ ඉලක්කය අනුව, කඩිනමින් සේවය ලබා දීම සඳහා ගිලන් රථ 450ක් සහ උපස්ථ ගිලන් රථ 25ක් අවශ්‍ය බවත් දැනට ගිලන් රථ 150ක හිඟයක් ඇති බවත් හඳුනාගෙන ඇත. ඒ අනුව, ඉන්දියාවේ TATA Sons (Pvt) Ltd ආයතනය විසින් ගිලන් රථ 50ක් නොමිලේ ප්‍රදානයක් වශයෙන් ලබා දීමටත් ආසියානු සංවර්ධන බැංකුව විසින් ගිලන් රථ 45ක් ප්‍රදානයක් වශයෙන් ලබා දීමටත් එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එකී ගිලන් රථ "1990 සුව සැරිය පදනම" වෙත ලබා ගැනීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් උදෙසා අධි බල විකිරණ ශක්තිය සහිත උසස් ගුණත්වයෙන් යුත් විකිරණ චිකිත්සක උපකරණ සැපයීම**

පිළිකා සත්කාරක සේවා සඳහා යොදා ගනු ලබන රේඛීය ත්වරණකාරක යන්ත්‍ර 14ක් අදියර 2ක් යටතේ සැපයීම පිණිස එක්සත් රාජධානියේ ඉලෙක්ටා සමාගම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය අතර 2013 වර්ෂයේදී ගිවිසුමකට එළඹ ඇත. ඒ අනුව, එම ව්‍යාපෘතියේ පළමු අදියර මේ වන විට ක්‍රියාත්මක කර ඇති අතර, දෙවන අදියර මේ දක්වා ක්‍රියාත්මකව නොමැත. මේ වන විට යොදා ගනු ලබන නවීන පිළිකා

සත්කාරයේ ප්‍රතිශතගත බොහෝ වැදගත් අංගයන් 2013 වසරේදී අත්සන් කරන ලද මුල් ගිවිසුමේ පිරිවිතර තුළ නොපවතින බැවින්, වැඩිදියුණු කරන ලද යන්ත්‍ර සපයා ගැනීම සඳහා ශ්‍රී ලංකා පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරු විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, සෞඛ්‍ය ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සැලකිල්ලට ගෙන, පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරු විසින් ඉදිරිපත් කළ නිර්දේශ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත පදනම්ව මහනුවර ජාතික රෝහල, කරාපිටිය ජාතික රෝහල, යාපනය ශික්ෂණ රෝහල සහ මඩකලපුව ශික්ෂණ රෝහල වෙත පළමු අදියර යටතේ සපයා දී ඇති රේඛීය ත්වරණකාරක යන්ත්‍ර වැඩිදියුණු කිරීමටත්, දෙවන අදියර යටතේ රත්නපුර, බදුල්ල, හම්බන්තොට, අනුරාධපුර සහ කුරුණෑගල යන රෝහල් 05 සඳහා නවීනතම වර්ගයේ විකිරණ චිකිත්සක උපකරණ ප්‍රමුඛතා පදනම මත 2024-2026 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ සපයා ගැනීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

10. **2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ ලියාපදිංචි කරන ලද සමාගම් නැවත ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස විශේෂ විධිවිධාන පනතක් හඳුන්වා දීම**

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සමාගම්වලට අදාළ ක්‍රියාපටිපාටි, මෙහෙයුම් සහ වෙනත් අවශ්‍යතා 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ දැක්වෙන අතර, 2024-03-31 දින වන විට එම පනත යටතේ සංස්ථාපනය කර හෝ ලියාපදිංචි කර ඇති සමාගම් සංඛ්‍යාව ආසන්න වශයෙන් 199,484ක් පමණ වේ. මේ වන විට එකී පනත යටතේ සංස්ථාපනය හෝ ලියාපදිංචි කර ඇති සමාගම් අතුරින්, සක්‍රිය තත්ත්වයේ පවතින සමාගම් ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා දැනට පවතින පනතෙහි ප්‍රතිපාදන නොමැති බැවින්, ඒ සඳහා නව නීතියක් පැනවීම යෝග්‍ය බවට හඳුනාගෙන තිබේ. ඒ අනුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ ලියාපදිංචි කරන ලද සමාගම් නැවත ලියාපදිංචි කිරීමට විධිවිධාන සැලසීම සඳහා නව නීතියක් හඳුන්වා දීමටත්, ඒ සඳහා සකස් කරනු ලැබ ඇති සංකල්ප පත්‍රිකාව මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත් කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ජර්මනියේ බර්ලින් බෞද්ධ මධ්‍යස්ථානය ස්ථාපිත කොට වසර 100ක් ගතවීම අනුස්මරණය කිරීම**

ජර්මනියේ බර්ලින් නුවර පිහිටි බෞද්ධ මධ්‍යස්ථානය ස්ථාපිත කොට 2024 වර්ෂය වන විට වසර 100ක් සැපිරීම වෙනුවෙන් බර්ලින් නුවර ශතසංවත්සර උළෙලක් පැවැත්වීමට නියමිතව ඇත. එකී ශතසංවත්සර උළෙලට සමගාමීව කොළඹ කේන්ද්‍රීයව ද වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සංවිධාන කර තිබේ. එම වැඩසටහන යටතේ විජිත යාපා ප්‍රකාශකයින් විසින් මුද්‍රණය කොට ඇති Das Buddhistische Haus (1924-2024) කෘතිය එළිදැක්වීමට හා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව මඟින් ශතසංවත්සර සමරු මුද්දරයක් නිකුත් කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා නියෝග ඉදිරිපත් කිරීම**

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම්කිරීමේ පද්ධති පනතේ 11 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 17 වන වගන්තිය යටතේ 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග, අංක 2382/11 දරන 2024-04-30 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. එකී නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර ලෙස නම් කිරීම**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර ලෙස පහත සඳහන් ව්‍යාපාර නම් කිරීමටත්, එම පනතේ IIවන උපලේඛනය යටතේ දක්වා ඇති පනත්වලින් යෝජිත නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් එකී ව්‍යාපාර වෙත ප්‍රදානය කිරීමටත්, ඒ සඳහා වන නියමයන් රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදන මඟින් ප්‍රකාශයට පත් කිරීමටත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* Horizon Group USA Global LLC.
* Satguru Travel and Tourism LLC.

- Pagero Lanka Software Engineering (Pvt) Ltd.
- KPMG Professional Services (Private) Ltd.
- Hexaware Technologies SL (Private) Ltd.
- Creative Software (Pvt) Ltd.
- Remediumone Global Private Limited.
- GTN Group Holding Limited.
- IPD Colombo (Private) Limited.
- Bistec Solutions (Pvt) Ltd.
- Port City Duty Free (Pvt) Ltd.
- China Duty Free (Lanka) (Pvt) Ltd.
- ODF Pte Ltd.

## 14. වැවිලි අංශයේ ගුරුවරුන් සඳහා "විද්‍යා වර්ධන/අරිවෙලුච්චි/STEM සවිබල ගැන්වීමේ" ගුරු පුහුණු වැඩසටහන දියත් කිරීම

වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස හඳුනා ගනු ලබන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් බිලියන 3ක ප්‍රදානයක් ලබා දීමට ඉන්දීය රජය විසින් එකඟතාව පළ කර ඇත. ඒ යටතේ එක් ව්‍යාපෘතියක් වශයෙන් වැවිලි ප්‍රජාවේ සිසුන් අතර විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) යන විෂයයන් හැදෑරීම දිරිගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හඳුනා ගනු ලැබ ඇත. ඒ යටතේ වතුකරයේ පාසල්වල සුදුසුකම් ලත් STEM ගුරුවරුන්ගේ බරපතල හිඟය පියවීම සඳහා "විද්‍යා වර්ධන/අරිවෙලුච්චි/STEM සවිබල ගැන්වීමේ" ගුරු පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා සහ ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 15. වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතෙහි 10 වන වගන්තිය යටතේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අතර, එම වාර්තාව 2024 වසරේ ජූනි මස අවසන් දින වන විට මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කළ යුතු වේ. ඒ අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර තිබේ. ඒ අනුව, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 16. 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත පරිච්ඡින්න කිරීම සඳහා වන පනත

1972 අංක 7 දරන ගෙවල් කුලී පනත පරිච්ඡින්න කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2023-09-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එම පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 17. නිවැසියන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත

1972 අංක 7 දරන ගෙවල් කුලී පනත පරිච්ඡින්න කිරීමෙන් අනතුරුව, කුලී නිවැසියාගේ සහ ගෙවල් හිමියාගේ අයිතිවාසිකම් සමාන ලෙස ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන නව නීතියක් හඳුන්වා දීම පිණිස 2023-09-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

තිබේ. මහජනතාව අපහසුතාවට පත් වන පරිදි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට සම්බන්ධ නොවී එම දින දෙකෙහිදීම සේවයට වාර්තා කරන ලද විධායක සේවා ගණයට අයත් නොවන රාජ්‍ය නිලධාරින් සඳහා විශ්‍රාම වැටුපට අදාළ නොවන පරිදි විශේෂ වැටුප් වර්ධකයක් ලබා දීමටත්, ඔවුන් සියලු දෙනා සඳහා ඉදිරි උසස්වීම් සඳහා අදාළ කර ගත හැකි විශේෂ ප්‍රශංසා සහතිකයක් නිකුත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 21. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(2), 62(2) සහ 83(ආ) යන ව්‍යවස්ථාවන්හි ජනාධිපතිවරයාගේ ධුර කාලය සහ පාර්ලිමේන්තුව පවත්නා කාලය සම්බන්ධයෙන් අනනුකූලතාවක් පවතින බව නිරීක්ෂණය වේ. ඒ පිළිබඳව වන සැකය මග හරවා ගැනීමට සහ කවර හෝ අනනුකූලතාවක් ඉවත් කිරීමට "සාවුරුද්දක් ඉක්මවා" යන වචන වෙනුවට "පස් අවුරුද්දක් ඉක්මවා" යන වචන ආදේශ කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83(ආ) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 22. වතු කම්කරුවන් සඳහා සාධාරණ වැටුපක් ගෙවීම සම්බන්ධයෙන් ඇතැම් ප්‍රාදේශීය වතු සමාගම් විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතා

ජීවන වියදම සහ මෑත කාලීනව රට තුළ පැන නැගී ඇති ආර්ථික අර්බුදයේ බලපෑම් කෙරෙහි නිසි සැලකිල්ලක් යොමු කරමින් වතු කම්කරුවෙකු සඳහා දිනකට ගෙවිය යුතු වැටුප තක්සේරු කරන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ට 2024-05-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උපදෙස් දී ඇත. එමෙන්ම, එකී වැටුප ගෙවීම සඳහා එක් එක් ප්‍රාදේශීය වතු සමාගම් සතුව පවතින හැකියාව නිශ්චය කිරීම පිණිස කමිටුවක් පත් කිරීම සඳහා ද එම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ තිබේ. එකී කමිටුවේ නිර්දේශ මත පදනම්ව හැකියාව තිබියදීත් සිය වතු කම්කරුවන් වෙත නියමිත වැටුප නොගෙවනු ලබන ප්‍රාදේශීය වැවිලි සමාගම් සමඟ රජය එළඹ ඇති ඉඩම් බදු ගිවිසුම් අවලංගු කිරීම පිණිස අවශ්‍ය නීති පැනවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා මෙම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී.

**23. පාසල්වල ඉගැන්වීමේ කටයුතු සහ රෝහල්වල රෝගී සත්කාරක සේවා බාධාවකින් තොරව පවත්වාගෙන යාම**

පාසල් පැවැත්වෙන කාලසීමාවන්වලදී ඉගැන්වීමේ කටයුතුවලට බාධාවන් සිදු වන අයුරින් සහ රෝහල්වල රෝගී සත්කාරක සේවා අඩපණ වන අයුරින් ඇතැම් කණ්ඩායම් විසින් සිදු කරනු ලබන බලපෑම් හා අනිසි ක්‍රියා පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු කරන ලදුව, එවැනි අනීතික ක්‍රියා මගින් පාසල් සිසු දරුවන්ට සහ රෝගීන්ට සිදු කරනු ලබන අසාධාරණයන් වැළැක්වීම පිණිස නව නීති හඳුන්වා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

*************